# <u>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.</u>

## <u>භාවිතයෙන් ඉවත් කරන ලද වාහන, විකිණීම සඳහා මිල ගණන් කැඳවීම.</u>

## <u>උපදෙස් හා කොන්දේසි මාලාව.</u>

1. 2026.07.17 වෙනි දින ජාතික පුවත්පත්වල පළ වූ පුවත්පත් දැන්වීම පරිදි මෙම අධිකාරියට අයත් භාවිතයෙන් ඉවත් කරන ලද වාහන විකිණීම පිණිස 2026.07.17 වන දින පෙ.ව. 9.30 සිට 2026.08.07 වන දින පෙ.ව.11.00 දක්වා මිල ගණන් භාරගනු ලැබේ. ඒ අනුව මහවැලි අධිකාරියේ <u>කොළඹ ප්‍රධාන කාර්යාලය, බී කලාපය - වැලිකන්ද, සී කලාපය - දෙහිඅත්තකන්ඩිය, වික්ටෝරියා /ඊ කලාපය - දිගන, එච් කලාපය - (නිරාවිය ගොවිපල/ යාන්ත්‍රික වැඩපල - තඹුත්තේගම), වලව කලාපය - ඇඹිලිපිටිය, එල් කලාපය - වැලිඔය, මහවැලි ආරක්ෂක බලකාය - දිගන, රඹකැන්ඔය කලාපය- මහඔය, මොරගහකන්ද කලාපය - (යාන්ත්‍රික වැඩපල - බකමූණ) හා ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය (දිගන,)</u> යන ස්ථානයන්හි දී (ඇමුණුම 02) මෙම වාහන 2026.07.17 දින සිට 2026.08.06 දින දක්වා පෙ.ව. 9.30 සිට ප.ව.3.00 තෙක් (රජයේ නිවාඩු දිනයන් සහ සති අන්ත දිනයන් හැර) පරික්ෂා කර බැලිය හැකිය.

2. භාවිතයෙන් ඉවත් කරන ලද වාහන සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට අයදුම්පත් නිකුත් කිරීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පහත සඳහන් කාර්යාල වලදී සිදු කෙරේ.

| | | | |
|---|---|---|---|
| I. | ප්‍රධාන කාර්යාලයේ 07 වන මහලේ මුදල් අංශයේ ගණකාධිකාරී (වත්කම්/ ගබඩා) වෙතින් හා, | | |
| II. | බී කලාපය | - | වැලිකන්ද |
| III. | සී කලාපය | - | දෙහිඅත්තකණ්ඩිය |
| IV. | මොරගහකන්ද (ජී) කලාපය | - | මොරගහකන්ද (බකමූණ) |
| V. | එච් කලාපය | - | තඹුත්තේගම |
| VI. | එල් කලාපය | - | සම්පත්නුවර, වැලිඔය |
| VII. | වික්ටෝරියා / ඊ කලාපය | - | දිගන |
| VIII. | රඹකැන්ඔය කලාපය | - | මහඔය |
| IX. | වලව විශේෂ බල ප්‍රදේශය | - | ඇඹිලිපිටිය |
| X. | මහවැලි ආරක්ෂක බලකාය | - | දිගන |
| XI. | ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය | - | දිගන |

ඉහත කාර්යාලවල ගණකාධිකාරී / ගිණුම් නිලධාරී වෙතින් 2026.07.17 දින සිට 2026.08.06 දින දක්වා පෙ.ව.9.30 සිට ප.ව.3.00 තෙක් ආපසු නොගෙවන තැන්පතුවක් ලෙස රු. 3500/- ක මුදලක් ගෙවීමෙන් පසු මෙම අයදුම්පත් ලබා ගත හැකියි. (රජයේ වැඩ කරන දින වල)

3. උක්ත වාහනවල දැනට පවතින හිඟ ආදායම් බලපත්‍ර ගාස්තු වාහන මිලදී ගන්නා අය විසින් දැරිය යුතු වේ. (ඇමුණුම 03)

4. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ගණකාධිකාරී නිකුත් කරනු ලබන අයදුම්පත්‍ර පමණක් මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා භාවිතා කල යුතුය. නියමිත අයදුම්පත්‍රයෙන් බාහිරව මිල ගණන් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. භාවිතයෙන් ඉවත් කරන ලද වාහන සඳහා ඉදිරිපත්කරන අයදුම්පත්‍රය සමගම රු. 3500/- ක් ගෙවා ලබා ගත් ලදුපතේ පිටපතක් යා කල යුතුය.

6. අදාල අයදුම්පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සමඟ එම වටිනාකමින් 5% කට සමාන මුදලක් **<u>ආපසු ගෙවන</u>** ඇප තැන්පතුවක් ලෙස ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. වාහන කීපයක් සඳහා මිල ගණන් ඉදිරිපත් කරන අයදුම්කරුවන් එක් එක් වාහනය සඳහා අදාල වන ආපසු ගෙවනු ලබන ඇප තැම්පතු මුදල තැම්පත්කර ටෙන්ඩර් අයදුම් පත්‍රයේ ඇමුණුම 01 හි එක් එක් වාහනය ඉදිරියෙන් සඳහන් කළ යුතුය. ඇප තැන්පත් සඳහා,

   i. පිළිගත් වාණිජ බැංකුවකින් අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (Director General, Mahaweli Authority Of Sri Lanka) නමට දින 60 ක වලංගු කාලයකට බැංකු අණකරයක් (Bank Draft) ලබා ගෙන හෝ

Reference only

ii. අදාළ මුදල ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ඉහත 02 හි සඳහන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යාලයක් වෙත ගෙවීමෙන් පසු නිකුත් කරනු ලබන ලදු පත ලබා ගෙන එහි මුල් පිටපත මිල ගණන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රයට අමුණා යොමු කල යුතුය.

7. සියළුම වාහන වෙන වෙනම ඇගයීමට ලක් කරන අතර කොන්දේසි සියල්ල සපුරා ඇති හා තක්සේරු වටිනාකම ඉක්මවන ඉහළම මිල ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් තාක්ෂණික ඇගයීම් කමිටුවෙහි නිර්දේශයන් මත තෝරා ගැනීම සිදු කරනු ලබයි. තෝරා ගන්නා ලද අයදුම්කරුවන්ට දැන්වීමෙන් පසු එම භාණ්ඩ දින 14 ක් ඇතුලත සියළුම ගෙවීම් සම්පූර්ණ කර පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු අතර ඉන් පසු මෙම බැංකු අණකරය නිදහස් කරනු ලැබේ. කොන්දේසි කඩ කරන ටෙන්ඩර් ලාභීන්ගේ තැම්පතු මුදල (බැංකු අණකරය හෝ ගෙවන ලද මුදල) ආපසු නොගෙවන අතර අදාළ භාණ්ඩ ලබා ගැනිමට සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට මෙම බැංකු අණකරය ටෙන්ඩර් පත් විවෘත කල දින සිට මාස 02 ක් ඇතුළත ආපසු ලබා දෙනු ලැබේ.

8. නිසි ලෙස සම්පූර්ණ කරන ලද මිල ගණන් සහිත අයදුම්පත්‍රය 2026.08.07 දින පෙ.ව.11.00 ට පෙර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ 09 වන මහලේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. නැතහොත් 2026.08.07 දින පෙ.ව.11.00 ට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ප්‍රසම්පාදන අංශය, අංක 500, ටී.බී.ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතුය. 2026.08.07 දින පෙ.ව.11.00 ට පසු ලැබෙන (ප්‍රමාද වී ලැබෙන) සියළුම මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිල ගණන් විවෘත කිරීම, මිල ගණන් ලබා ගැනීම අවසන් වූ වහාම මෙම ලිපිනයෙහිදීම සිදු කරනු ලබන අතර ඒ සඳහා අයදුම්කරුට හෝ නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

9. ඉහත අංක 02 යටතේ දක්වා ඇති ස්ථාන වලින් අයදුම්පත්‍රය ලබා ගත හැකි වුවද සම්පූර්ණ කරන ලද මිල ගණන් සහිත අයදුම්පත්‍රය අංක 08 හි සඳහන් පරිදි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී.ජයා මාවත, කොළඹ 10 ලිපිනයේ පිහිටා ඇති <u>ප්‍රධාන කාර්යාලය වෙත පමණක්</u> යොමු කල යුතුය.

10. මිල ගණන් බහාලන කවරය ඉහළ වම් කෙළවරේ "භාවිතයෙන් ඉවත් කරන ලද වාහන සඳහා මිල ගණන් කැඳවීම" යනුවෙන් සටහන් කල යුතුය. දකුණු කෙළවරේ පහළින් මිල ගණන් ඉදිරිපත් කරන අයගේ නම සහ ලිපිනය හා දුරකතන අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

11. භාණ්ඩ පරික්ෂා කර මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර , අඩුපාඩු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වග කියනු නොලැබේ.

12. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදි මතුවන ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

13. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී එක් එක් වාහනය සඳහා වෙන් වෙන් වශයෙන් මිල ගණන් ඉදිරිපත් කල යුතු අතර (ඇමුණුම 01 මගින්) උපදෙස් හා කොන්දේසි වලට අනුකූල නොවන අයදුම්පත් ඇගයීම් ක්‍රියාවලියේදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

Reference only

එච්.එම්.ජේ.කේ හේරත්,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.
අංක 500, ටී.බී.ජයා මාවත,
කොළඹ 10.